# 02



# ගමට හොඳ පාරක්



(ශබ්ද විකාශන යන්ත්‍රයක් සවි කළ වාහනයක් හන්දියට පැමිණෙයි. ඒ තුළ සිටින එක් අයෙක් නිවේදනයක් කියවයි. එම නිවේදනය මුළු ප්‍රදේශයට ම ඇසෙයි.)

*   *   *   *   *   *   *   *   *

"කරුණාකර සවන් දෙන්න, මහා ශ්‍රමදානයක්"



"පසන්ගම ග්‍රාම සංවර්ධන සමිතිය ඇල්ලේකුඹුර මාර්ගය අලුත් වැඩියා කිරීම සඳහා මහා ශ්‍රමදානයක් සංවිධානය කර තිබෙනවා. පසන්ගම හන්දියේ සිට ඇල්ලේකුඹුර මහා විද්‍යාලය දක්වා පාරට කොන්ක්‍රීට් දමා

සකස් කිරීමටත් පාර දෙපැත්තේ කාණු කැපීමටත් බලාපොරොත්තු වෙනවා.

මෙම මස 28 වන ඉරිදා උදේ හතට ඇල්ලේකුඹුර මහ විදුහල අසලින් ශ්‍රමදානය ආරම්භ වෙනවා. ගමේ දියුණුවට අත දෙන්න, හැම දෙනා ම එක්වන්න.

මේ උදාර කටයුත්තට සහභාගි වී සහයෝගය දක්වන මෙන් ඔබට කරන කාරුණික ආරාධනයයි, මේ.

ස්තුතියි."

**(හන්දියේ කඩේට රැස්වූ පිරිස ශ්‍රමදානය පිළිබඳ ව කතා කරති.)**

"අන්න ඇහුණා නේ ද?"

"ඔව්, බොහොම හොඳ වැඩක්, එහෙම නේ ද සියාතු මාමේ?"

"ඔව් මහත්තයා, ඔය පාරට කී සැරයක් තාර දැම්මා ද? වැඩක් වුණා ද?"

"ඒක හරි, කොන්ක්‍රීට් දාන එක හොඳයි."

"දවස කවදා ද?"

"ලබන ඉරිදා නේ ගුණපාල, යමු හැමෝ ම එදාට."

* * * * * * * * *

**(ශ්‍රමදානය දා, ගම්වැසියෝ සූදානම් වෙති.)**

"සියාතු මාමේ! අපි උවමනා උපකරණ ටික එකතු කර ගෙන යමු."

"ඔව්, ඔව්, මම ගෙවල් කිහිපයකින් උදලු, තාච්චි, බාල්දි ඉල්ලාගෙන එන්නම්."

"ඒක හොඳයි සරත්, මම ලොකු බැරල් තුනක් ගේන්නම්."

"මට පුළුවනි මගේ අත්කරත්තෙ අරගෙන එන්න. එතකොට ඒ බඩු ටික ගෙනියන්න පුළුවන් නේ."

"ගුණපාල හොඳ වෙලාවට අත්ට්‍රැක්ටරය ගත්තේ. වැලියි, සිමෙන්තියි, කැටගලුයි ගෙනත් දෙන්න එයා පොරොන්දු වුණා."

* * * * * * * *

**(කුසුමාවතීගේ නිවස)**

"අක්කේ යන්න ලෑස්ති ද?"

"මේ ලෑස්ති වෙනවා. මල්ලියේ, මං දුවට කියන්නම් තේ ටික ගේන්න කියලා."

"සෝමදාස කිරිබත් ගේන්න බාරගත්තා. මං එහාට ගිහින් බලන්නම්. සිරිසේන මුදලාලි සීනිබනිස් ටික එතැනට ම එවන්නම් කීවා."

"මල්ලියේ, කෙසෙල්ගෙඩි ඉස්කෝලේ මහත්තයාගේ ගෙදරින්. එහාටත් ගොඩවැදිලා යන්න ඕනෑ."

"හරි හරි, අක්කේ! මං ආපහු එන ගමන් එහාටත් යනවා."

"පිඟන් කෝප්ප ග්‍රාමනිලධාරි මහත්තයාගෙන්. ඒ ගැනත් බලන්න."

"දුවේ, වතුර උණු වෙලා ද?"

'දැන් උණු වේගෙන එනවා අම්මේ."

"ලොකු පෝච්චි දෙක ම පිරෙන්න තේ හදන්න. සිරියාවතී නැන්දත් එයි උදවු කරන්න."

"අම්මේ, ඉඟුරු ටික කොහේ ද?"

"මේසේ උඩ ඇති. හරි යමු මල්ලියේ. එහෙනම් අපි යනවා දුවේ. ප්‍රමාද නොවී තේ ටික අරගෙන සිරියාවතී නැන්දාත් එක්ක එන්න."

"හා! හොඳයි අම්මේ අපි ඉක්මනින් එන්නම්."

* * * * * * * * *

**(ශ්‍රමදානය ආරම්භ වෙයි.)**

සමහරු පස් කපති. සමහරු ගල් තාච්චි ගෙන යති. ළහි ළහියේ පාරට කොන්ක්‍රීට් වැටෙයි. ගමෙහි සියලු දෙනාගේ ම සහභාගිත්වයෙන් අලුත් පාර ඉදි වෙයි.



## ක්‍රියාකාරකම 01



පන්තිය කණ්ඩායම්වලට බෙදී මේ පාඩම සංවාද ස්වරූපයෙන් ඉදිරිපත් කරන්න.
வகுப்பறை குழுக்களாகப் பிரிந்து இப்பாடத்தை கலந்துரையாடல் வடிவில் முன்வைக்குக.

## ක්‍රියාකාරකම 02



පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.
பின்வரும் வினாக்களுக்கு விடை தருக.

i. නිවේදනය කළේ කුමන කරුණක් ගැන ද?

ii. ශ්‍රමදානයක් සූදානම් කළේ කුමකට ද?

iii. පාරේ ඒ සඳහා තෝරාගත් කොටස කුමක් ද?

iv. ශ්‍රමදානය පැවැත්වෙන්නේ කවදා ද?

v. පාර හදන තැනට පිරිස රැගෙන ගිය බඩු මොනවා ද?

vi. ගම්වැසියන් ශ්‍රමදානය වෙනුවෙන් ලබා දුන් කෑම වර්ග මොනවා ද?

## ක්‍රියාකාරකම 03

මේ වචන ශබ්ද නගා කියන්න.
இவ் வசனங்களை உரத்து வாசிக்க.

ශබ්ද විකාශන යන්ත්‍රය
මහා ශ්‍රමදානය
කොන්ක්‍රීට් ඇතිරීම
අත්ට්‍රැක්ටරය
ග්‍රාමනිලධාරි
සහභාගිත්වය
ග්‍රාම සංවර්ධන සමිතිය

## ක්‍රියාකාරකම 04

හිස්තැන්වලට සුදුසු වචන පාඩමෙන් සොයා ලියන්න.
இடைவெளிகளுக்குப் பொருத்தமான சொற்களை பாடத்தில் தேடி எழுதுக.

i. ඔය පාරට කී සැරයක් .................................. දැම්මා ද?

ii. ගුණපාල හොඳ වෙලාවට ............................ ගත්තේ.

iii. සෝමදාස ........................... ගේන්න බාර ගත්තා.

iv. ලොකු ......................... පිරෙන්න තේ හදන්න.

v. අම්මේ ........................... ටික කොහේ ද?

## ක්‍රියාකාරකම 05

පහත දැක්වෙන නිවේදන අවස්ථාවෝචිත ව පන්තියට ඉදිරිපත් කරන්න.
பின்வரும் அறிவிப்புக்களை பொருத்தமான முறையில் வகுப்பறையில் முன்வைக்கவும்.

i. තුන්වන වේදිකාවට දැන් පැමිණි දුම්රිය වව්නියාව බලා පිටත් වේ.

ii. අතිගරු ජනාධිපතිතුමා ජාතිය අමතා කරන කතාව රාත්‍රි ප්‍රවෘත්ති විකාශයෙන් පසු බලාපොරොත්තු වන්න.

iii. විශේෂ නිවේදනයයි. තූර්යවාදක කණ්ඩායම ආරාධිත අමුත්තන් පිළිගැනීම සඳහා ගේට්ටුව අසලට යන්න.

iv. තව ටික වේලාවකින් ආරාධිත අමුත්තන් උත්සව භූමියට පැමිණෙනු ඇත.

v. මීටර 100 ධාවන තරගයට සහභාගි වන වයස අවුරුදු 11න් පහළ ක්‍රීඩිකාවන් ආරම්භක ස්ථානයට වාර්තා කරන්න.

## ක්‍රියාකාරකම 06

කනිෂ්ඨ සාහිත්‍ය සංගමය බ්‍රහස්පතින්දා උදේ 10.00ට විද්‍යාලයීය ශාලාවේ දී රැස්වීමට නියමිත ය. මේ බව සාමාජික/සාමාජිකාවන්ට දැන්වීම සඳහා නිවේදනයක් සකසන්න.
கனிஷ்ட இலக்கிய மன்றம் வியாழக்கிழமை காலை 10 மணிக்கு பாடசாலை மண்டபத்தில் கூட உள்ளது. இது பற்றி உறுப்பினர்களுக்கு அறிவிக்கவென அறிவித்தல் ஒன்றைத் தயாரிக்க.

## ක්‍රියාකාරකම 07

ගම්වැසියන්ගේ සාමූහිකත්වය පිළිබඳ තොරතුරු පාඩමෙන් හෙළි වන ආකාරය පැහැදිලි කරන්න.
கிராமத்தவர்களின் ஒற்றுமையை தொடர்பான தகவல்கள் பாடத்தின் ஊடாக வெளிப்படுத்தப்படும் விதத்தை விளக்குக.